මුතූර් ප්‍රාදේශීය සභාව
ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය
----------------------

1. මූල්‍ය ප්‍රකාශන
--------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
-----------------------------------

2017 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අප්‍රේල් 16 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 අගෝස්තු 17 දින සභාපති වෙත ඉදිරිපත් කරන ලදී.

1.2 තත්ත්වාගණනය මතය
------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට මුතූර් ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
-----------------------------------

1.3.1 විගණනය සඳහා සාක්ෂි නොමැතිකම
----------------------------------------

අත්තිකාරම් ලේඛනයක් නොමැතිකම නිසා රු.11,139,745 ක්වූ අත්තිකාරම් ශේෂ විගණනයේදී තහවුරු කළ නොහැකි විය.

1.3.2 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම
-------------------------------------------------------------------------

නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | |
| | පරිච්ඡේදය x 193 වගන්තිය | විචලනයන් පිළිබඳ විස්තර සකස් කර, ඊට හේතු විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම සඳහා වර්ෂයේ සත්‍ය ආදායම සහ වියදම් අයවැයගත ආදායම් හා වියදම් සමඟ සසඳා නොතිබුණි |
| (ආ) | මෝටර් රථ ප්‍රවාහන පනත 203 වගන්තිය | සියලු වාහන සඳහා වාර්ෂික ආදායම් බලපත්‍ර ලබාගත යුතු නමුත්, සභාව විසින් භාවිතා කළ වාහන නවයක් සඳහා ආදායම් බලපත්‍ර ලබාගෙන නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉකුත් වර්ෂයේ පුනරාවර්ථන වියදම ඉක්මවූ රු.6,432,080 ක්වූ ආදායම 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ රු.103,812 ක්වූ ආදායම සමඟ සැසඳූ විට රු.6,328,268 ක මූල්‍ය ප්‍රතිඵලයේ පිරිහීමක් පෙන්නුම් කෙරුණි. කුලී ආදායම රු.3,871,917 කින් හා වෙනත් ආදායම් රු.1,181,517 කින් අඩුවීම පිරිහීමට හේතු විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්,බිල් කළ ආදායම්,රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය සඳහා වූ ඉදිරිපත් කරන ලද ඇස්තමේන්තුගත ආදායම බිල්කළ ආදායම්, රැස්කළ ආදායම පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | **2017** | | | | **2016** | | | |
|---|---|---|---|---|---|---|---|---|
| **ආදායම් ප්‍රභවය** | **ඇස්තමේන්තු ගත ආදායම** | **බිල්කළ ආදායම** | **රැස්කළ ආදායම** | **දෙසැම්බර් 31 දිනට මුළු හිඟය** | **ඇස්තමේන්තුගත ආදායම** | **බිල්කළ ආදායම** | **රැස්කළ ආදායම** | **දෙසැම්බර් 31 දිනට මුළු හිඟය** |
| | රු. | රු. | රු. | රු. | රු | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 806 | 816 | 460 | 346 | 786 | 786 | 727 | 58 |
| කුලී | 11,960 | 9,477 | 11,057 | 902 | 15,236 | 13,349 | 9,660 | 5,557 |
| බලපත්‍ර ගාස්තු | 1,075 | 1,398 | 1,043 | 32 | 816 | 786 | 811 | 4 |
| වෙනත් ආදායම් | 13,334 | 9,367 | 9,367 | 3,966 | 12,415 | 8,767 | 8,707 | 3,708 |

### 2.2.2. වරිපනම් හා බදු

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වගන්තියෙන් නියමකර ඇති පරිදි, සභා ප්‍රදේශය තුළ වූ ඉඩම්, නිවාස සහ ගොඩනැගිලිවලින් එකතුව රු.5,679,761 ක්වූ වරිපනම් හා බදු අයකර නොතිබුණි.

### 2.2.3 වෙළඳ පොළ කඩ කාමර කුලී

පුරනැඟුම ව්‍යාපෘතිය යටතේ 2013 වර්ෂයේදී සලසන ලද ප්‍රතිපාදන යටතේ රු.22,820,738 ක පිරිවැයකින් ඉදිකරන ලද කඩ කාමර 40 කින් සමන්විත සාප්පු සංකීර්ණය 2014 වර්ෂයේදී බදු දී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

i. 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 173 වගන්තිය ප්‍රකාරව ගිවිසුම් අත්සන් කිරීමෙන් පසු කඩ කාමර කුලියට දිය යුතු වේ. එනමුත් ඉහත සඳහන් කඩ කාමර 40 න් කඩකාමර 33 ක් සඳහා පමණක්, බදු කාලය සඳහන් නොකර ගිවිසුම් අත්සන්කර තිබුණි.

ii. මෙම කඩකාමර සඳහා 2014 ජනවාරි 01 සිට 2017 දෙසැම්බර් 31 දක්වා කාල පරිච්ඡේදයට අදාළ රු.1,248,750 ක්වූ බදු කුලී අයකර ගැනීම සඳහා විගණන දිනය දක්වා සභාව විසින් කටයුතු කර නොතිබුණි.

2.2.4 ගවමස් කඩ බදු දීම

--------------------

ගෙවීම් පැහැර හරින අවස්ථාවලදී මස්කඩ කරුවන්ගේ තැන්පතුවලින් හිඟ ගවමස් කඩ කුලිය අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි. මූල්‍ය ප්‍රකාශනවල රු.8,303,154 ක හිඟ මුදලක් පෙන්නුම් කෙරිණි. මෙම හිඟ මුදල් පිළිබඳ කාල විශ්ලේෂණයක් සභාව විසින් විගණනය සඳහා ඉදිරිපත් නොකරන ලදී. විගණනයේදී ශේෂ තහවුරු කළ නොහැකි විය.

3. මෙහෙයුම් සමාලෝචනය

---------------------------

3.1 කාර්යසාධනය

----------------------

(අ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

---------------------------------

සභාව විසින් දිනකට ඝන අපද්‍රව්‍ය ටොන් 4 ක් රැස් කෙරෙයි. එසේ එකතු කෙරෙන අපද්‍රව්‍ය පරිසර ගැටළු ඇති කරමින් ගංහාව අසල පෞද්ගලික ඉඩමකට බැහැර කර තිබුණි.

(ආ) පරිසර ගැටළු

----------------

යුනිසෙෆ් ආධාර යටතේ අපජල බස්නා සැකසුම් යන්ත්‍රයක් සභාවට භාරදී තිබුණි. එදින පටන්ම මෙය භාවිතා කර නොතිබුණි. එනිසා ප්‍රදේශය තුළ රැස් කෙරෙන අසූචි බැහැර කිරීම අපද්‍රව්‍ය බැහැර කරන ස්ථානයේම සිදුකිරීම නිසා පරිසර ගැටළු සිදුවී තිබුණි.

(ඇ) තිරසාර සංවර්ධන ඉලක්ක

------------------------------

2017 අංක 19 දරන තිරසාර සංවර්ධන ඉලක්ක පනතට අනුකූලව සභාව විසින් අරමුණු හා ඉලක්ක හඳුනාගෙන නොතිබුණි. 2030 වන විට ඉටුකළ යුතු තිරසාර සංවර්ධන ඉලක්ක පිළිබඳව සභාව දැනුවත් වී නොතිබුණි.

3.2 කළමනාකරණ දුර්වලතා

-----------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) වෙනත් ආයතන විසින් පරිත්‍යාග කරන ලද වාහන 12 ක් පසුගිය වසර 12 ක් තිස්සේ සභාව විසින් භාවිතා කර තිබුණි. එනමුත් එම වාහනවල අයිතිය ලබාගැනීම සඳහා සභාව විසින් කටයුතු කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XIX පරිච්ඡේදයේ 1.6 සහ 4 වගන්තිය ප්‍රකාරව සේවකයින් තිදෙනෙකුට ප්‍රදානය කරන ලද රු.108,620 ක්වූ ණය අයකර ගැනීම සඳහා පසුගිය වසර 09 ක කාලය තුළදී කටයුතු කර නොතිබුණි.

(ඇ) අක්‍රිය ජංගම ගිණුමක රු.55,351 ක ශේෂයක් පසුගිය වසර 10 ක් තිස්සේ පැවතුණි. විගණන දිනය වූ 2018 ජූනි 20 දිනය වන විටත්, එකී ගිණුම සක්‍රීය කර ආදායම් උපයා ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි.

(ඈ) සාම්පූර්හි යළි පදිංචි කරනු ලැබූ ප්‍රතිලාභීන් 200 දෙනෙකුට ජලය සැපයීම සඳහා 2016 දෙසැම්බර් 25 දින යුනිසෙෆ් ආධාර යටතේ රු.756,311 ක මුදලක් ගෙවා තිබුණි. එනමුත් ප්‍රතිලාභීන් 17 දෙනෙකුට මේ දක්වාම ජල සැපයුම ලබාදී නොතිබුණි.

(ඉ) සභාවේ සාම්පූර් සහ මල්ලිකායිතිව් පුස්තකාලවල අ.පො.ස(සා.පෙළ) සහ උසස් පෙළ ශිෂ්‍යයන් සඳහා අවශ්‍ය පොත් නොතිබුණි. එනිසා එම පුස්තකාලවලින් ශිෂ්‍යයන්ට අවශ්‍ය ප්‍රතිලාභ නොලැබී තිබූ අතර, එම පුස්තකාලවල ඔවුන්ගේ පැමිණීම අඩුවී තිබුණි.

(ඊ) පුරනැගුම ව්‍යාපෘතියේ ප්‍රතිපාදන යටතේ රු.4,094,702 ක පිරිවැයකින් ස්ථාපනය කරන ලද මාතෘ සුරැකුම් මධ්‍යස්ථානයක් අපේක්ෂිත කටයුත්ත සඳහා භාවිතා කර නොතිබුණි.

(උ) පළාත් මූල්‍ය රීති 163.3 ප්‍රකාරව ලබාගත් අත්තිකාරම් දින 10 ක් තුළදී නිරවුල් කළ යුතු වේ. එනමුත් වසර 01 සිට වසර 10 ක් වූ කාලය තුළ දෙන ලද රු.17,018,175 ක්වූ අත්තිකාරම් පිළිබඳව කටයුතු කර නොතිබුණි.

3.3 වත්කම් කළමනාකරණය

---------------------------

3.3.1 අක්‍රීය වත්කම්

----------------

පහත සඳහන් නිරීක්ෂණ සිදු කෙරේ.

(අ) අලුත්වැඩියා කර භාවිතා කළ හැකි සභාවේ සීසෑම් යන්ත්‍ර හා පික්අප් රථය අලුත්වැඩියා කිරීමට හෝ වෙන්දේසි මගින් විකිණීමට කටයුතු නොකර, වසර 2 ක් පුරා අක්‍රීයව පැවතිණි.

(ආ) පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ රු.1,115,526 ක පිරිවැයකින් ඉදිකළ ජීව වායු පද්ධතිය ක්‍රියාත්මක කිරීම සඳහා වූ ගොඩනැගිල්ල 2016 දෙසැම්බර් 07 දින කොන්ත්‍රාත්කරු විසින් භාරදී තිබුණි. එනමුත්, මේ දක්වාම ගොඩනැගිල්ල අක්‍රීයව පැවතිණි.

3.4 ප්‍රසම්පාදන පරිපාටිය

-------------------------

3.4.1 ප්‍රසම්පාදන සැලැස්ම

------------------------

ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ 2006 මාර්තු 24 දිනැති අංක 128 චක්‍රලේඛ ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සභාව විසින් සකස්කර නොතිබුණි.

3.4.2 කොන්ත්‍රාත් පරිපාලනය

----------------------------

(අ) වාලික්කර්නි ප්‍රධාන පාර බොරළු ඇතිරීම

-----------------------------------------

වාලික්කර්නි ප්‍රධාන පාරේ බොරළු ඇතිරීම සඳහා වූ කොන්ත්‍රාතුව රු.1,926,960 ක මුදලට වාලම්මාඩි ප්‍රජා මධ්‍යස්ථානයට 2017 ඔක්තෝබර් 30 දින පිරිනමා තිබුණි. අරමුදල් සභාව විසින් ලබාදීමටත්, කර්මාන්තය 2017 දෙසැම්බර් 30 දින නිමකර සභාවට භාරදීමටත් අපේක්ෂිතව තිබුණි. එනමුත් වෙනත් වැඩ ඉටු නොකර රු.354,267 ක වටිනාකමැති පස් විගණන දිනය වූ 2018 ජුනි 20 දින වන විට පාරේ අතුරා තිබුණි. සුදුසු කොන්ත්‍රාත්කරුවකු තෝරා ගැනීමෙන් තොරව සභාව විසින් ප්‍රජා මධ්‍යස්ථානයට කොන්ත්‍රාත්ව පිරිනමා තිබූ නිසා වැඩ අත්හිටුවා තිබුණි.

(ආ) ක්‍රීඩා පිටියක් ඉදිකිරීම

---------------------------

පුරනැගුම ව්‍යාපෘතිය යටතේ රු.6,315,975 කට ඇස්තමේන්තු කළ කඩල්කාරයිඩ්වෙනායි ක්‍රීඩාපිටිය ඉදිකිරීමේ කර්මාන්තය අදාළ ඉඩමේ කොටසක් පුද්ගලයෙකුට අයත්වූ බැවින් රු.5,299,934 ක මුදලක්

වැය කිරීමෙන් පසු අත්හිටුවා තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් 2018 ජූනි 20 දින දක්වාම ක්‍රීඩාපිටිය අක්‍රීයව පැවතුණි.

4. වගකිම්භාරය සහ යහපාලනය

--------------------------------

අයවැය පාලනය

------------------

අයවැයගත සහ තත්‍ය වියදම් අතර සියයට 3 සිට 90 දක්වා වූ පරාසයන් හි විචලයක් පෙන්නුම් කරන ලද බැවින් අයවැය කාර්යක්ෂම කළමනාකරණ පාලන කාරකයක් වශයෙන් උපයෝජනය කර නොතිබුණි.

5. පද්ධති හා පාලන

-------------------

පහත සඳහන් පාලන ක්ෂේත්‍ර වෙනුවෙන් විශේෂ අවධානය අවශ්‍ය වේ.

| | පද්ධති හා පාලන | අවධානය අවශ්‍ය කරුණු |
|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් පාලනය | I. ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු කිරීම.<br>II. සභාවට අයත් අක්‍රීය වත්කම් ප්‍රයෝජනයට ගැනීම සඳහා කටයුතු කළ යුතුවේ. |
| (ආ) | කොන්ත්‍රාත් පරිපාලනය | I. කොන්ත්‍රාත්තු පිරිනැමීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කළ යුතු වේ.<br>II. ප්‍රජා මධ්‍යස්ථානවලට කොන්ත්‍රාත්තු පිරිනැමීමේදී මුදල් කොමිසමේ චක්‍රලේඛ අනුගමනය කළ යුතු වේ. |